# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

# අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2026

අ.පො.ස. (උ.පෙළ) විභාගය 2026 අගෝස්තු මස 10 දින ආරම්භ කර 2026 සැප්තැම්බර් මස 05 වන දින දක්වා, පැවැත්වෙන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම විභාගය සඳහා පෙනී සිටින පාසල් අයදුම්කරුවන්ගේ ප්‍රවේශපත්‍ර අදාළ පාසල අයත් කලාප අධ්‍යාපන කාර්යාලය වෙත ලබා දී ඇති අතර, සියලුම විදුහල්පතිවරුන් තම පාසලට අදාළ කලාප අධ්‍යාපන කාර්යාලයේ විභාග විෂයභාර සහකාර/නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ප්‍රවේශපත්‍ර භාර ගත යුතුය. කිසිදු ප්‍රමාදයකින් තොරව **පාසල් අයදුම්කරුවන්ගේ ප්‍රවේශපත්‍ර ඔවුන් වෙත වහාම බෙදා දිය යුතුය.**

අ.පො.ස. (උ.පෙළ) විභාගය සඳහා පෙනී සිටින පෞද්ගලික අයදුම්කරුවන්ගේ ප්‍රවේශපත්‍ර ඔවුන්ගේ පෞද්ගලික ලිපිනයට තැපැල් මඟින් යොමු කර ඇත.

උක්ත විභාගය සඳහා අයදුම් කළ පාසල් අයදුම්කරුවන්ගේ ප්‍රවේශපත්‍ර තම පාසල මඟින් ද, පෞද්ගලික අයදුම්කරුවනගේ ප්‍රවේශපත්‍ර තමා විසින් ද **2026.07.24** වන දින සිට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවිය වන www.doenets.lk වෙබ් අඩවිය වෙත පිවිසීමෙන් බාගත කර ගැනීම සිදු කළ හැකිය.

අ.පො.ස.(උ.පෙළ) විභාගය සඳහා ප්‍රවේශපත්‍ර නොලැබුණු හෝ ප්‍රවේශපත්‍ර බාගත කරගත නොහැකි වූ පෞද්ගලික අයදුම්කරුවන් වෙතොත් තමා ඉදිරිපත් කළ අයදුම්පත්‍රයේ පිටපතක්, විභාග ගාස්තු ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක් හෝ විභාග ගාස්තු ගෙවූ බවට තැපැල් ස්ථානාධිපතිගෙන් ලබා ගත් සහතික කළ ලිපියක් සමඟ විභාග දෙපාර්තමේන්තුව වෙත පැමිණිය යුතු ය.

විදුහල්පතිවරුන් හෝ පෞද්ගලික අයදුම්කරුවන් වෙත ලැබී ඇති **ප්‍රවේශ පත්‍රයන්හි විෂයය, මාධ්‍යය හා නාම සංශෝධන සිදු කර ගැනීමට ඇත්නම්,**

- සියලුම සංශෝධන මාර්ගගතව සිදු කර ගත යුතු අතර, ඒ සඳහා **https://onlineexams.gov.lk/eic** වෙබ් අඩවිය වෙත පිවිසිය යුතුය.
- එක් අයදුම්කරුවකුට මෙම සංශෝධන සිදු කර ගැනීමට ලැබෙනුයේ එක් අවස්ථාවක් පමණි.
- මෙම විභාගයේ විභාග මධ්‍යස්ථාන මාරු කිරීම් සිදු කරනු නොලැබේ.
- සංශෝධන සිදු කිරීම 2026.08.03 මධ්‍යම රාත්‍රී 12.00ට අවසන් වේ.

අයදුම්කරුවන්ගේ අනන්‍යතාව තහවුරු කිරීම සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ හැඳුනුම්පත, වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය මෙම විභාගය සඳහා පිළිගත් අනන්‍යතා පත්‍රයක් වශයෙන් පිළිගනු ලැබේ.

1. අයදුම්කරුවකු වෙනුවෙන් වෙනත් අයකු විභාගයට පෙනී සිටීම, සටහන් ළඟ තබාගෙන පිළිතුරු සැපයීම, වෙනත් අයදුම්කරුවෙකුගේ උදව් ලබාගැනීම, උදව් දීම හා විභාග ශාලාවේ හා ඒ අවට නොමනා හැසිරීම විභාග පනත යටතේ දඬුවම් ලැබිය හැකි වරදකි.
2. අ.පො.ස.(උ.පෙළ) විභාගයේ ගිණුම්කරණය, ඉංජිනේරු තාක්ෂණවේදය, ජෛව පද්ධති තාක්ෂණවේදය සහ තාක්ෂණවේදය සඳහා විද්‍යාව යන විෂයයන් සඳහා පමණක් වැඩසටහන් සම්පාදනය කළ නොහැකි සාමාන්‍ය ගණක යන්ත්‍ර භාවිතයට අවසර දෙනු ලැබේ.
3. දැනටත් කිසියම් රජයේ පාසලක ඉගෙනුම ලබන අයකු පෞද්ගලික අයදුම්කරුවකු වශයෙන් විභාගයට පෙනී සිටීම දඬුවම් ලැබිය හැකි වරදක් වන්නේය.
4. විභාග ශාලාව තුළට ජංගම දුරකථන, ස්මාට් වොච් හෝ ඉලෙක්ට්‍රොනික උපාංග රැගෙන ඒම සන්තකයේ තබා ගැනීම හා භාවිතය සපුරා තහනම් වේ. මෙම නියමය කඩ කරන අය වසර පහක විභාග තහනමකට ලක් විය හැකි අතර, අදාළ උපාංග රාජසන්තක වීමට ද ඉඩ ඇත.
5. විභාග අපේක්ෂකයන් බ්ලූටූත් (Bluetooth) වැනි විද්යුත් සන්නිවේදන උපකරණ/උපාංග (Electronic Communication Devices) භාවිතා නොකරන බව සහතික කර ගැනීම සඳහා විභාග ශාලාවේදී විභාගය පැවැත්වෙන කාලසීමාව තුළ තම මුහුණ සහ කන්දෙක විවෘතව පැහැදිලිව පෙනෙන සේ තබා ගත යුතුය. එම විභාග නීති උල්ලංඝනය කරනු ලබන අපේක්ෂකයින් සඳහා නීත්‍යානුකූලව කටයුතු කරනු ලැබේ.

**විමසීම් : දුරකථන අංක** : 011-2784537, 011-2784208, 011-2786616

**විද්‍යුත් ලිපිනය** : gcealexam@gmail.com

**ෆැක්ස් අංකය** : 011-2784422

**ක්ෂණික ඇමතුම්** : 1911

**තැපැල් ලිපිනය** : **විභාග කොමසාරිස්, පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව, පැලවත්ත, බත්තරමුල්ල.**

**විභාග කාල සීමාව තුළ පැය 24 පුරාම ක්‍රියාත්මක මෙහෙයුම් මැදිරිය දුරකථන අංක : 0112785211, 01127842028, 0112784537, 0112786616 ක්ෂණික ඇමතුම් අංකය : 1911**

**6/3/AL/2026**

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,**
**පැලවත්ත, බත්තරමුල්ල,**
**2026.07.24 දින**

**ඒ.කේ.එස්. ඉන්දිකා කුමාරි ලියනගේ**
**විභාග කොමසාරිස් ජනරාල්**